පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

අවසාන වාර පරීක්ෂණය - 2022

පාසලේ නම : ....

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : .... කාලය පැය 03 යි.

.... අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුයි :

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

❖ අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

01. ව්‍යාපාරයක් යන්න වඩාත් හොඳින් විස්තර කෙරෙන ප්‍රකාශය වන්නේ,
    (1) භාණ්ඩ හා සේවා අලෙවිකරණ ඕනෑම ස්ථානයක්
    (2) නිෂ්පාදන මිලට ගෙන බෙදාහරිනු ලබන ස්ථානයක්
    (3) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරන ඕනෑම කටයුත්තක්
    (4) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තක්

02. ව්‍යාපාර කිහිපයක් පහත දැක්වේ.

A	අධ්‍යාපන ආයතන	B	ඇඟලුම් කම්හල්	C	රක්ෂණ ආයතන
D	බේකරිය	E	රූපලාවන්‍ය ආයතන		

මේවා අතරින් සේවා නිෂ්පාදන ව්‍යාපාර යටතට ගත හැක්කේ,
    (1) A, B හා C ය. (2) A, C හා D ය.
    (3) A, C හා E ය. (4) A, D හා E ය..

03. ආයෝජනයේ සුරක්ෂිතතාවය තහවුරු කරගැනීම ව්‍යාපාරයේ අනාගත වර්ධනය ඉහළ නංවා ගැනීමේ අරමුණින් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වනු ලබන්නේ,
    (1) කළමනාකරුවන් (2) අයිතිකරුවන්
    (3) මූල්‍ය ආයතන (4) ගනුදෙනුකරුවන්

04. ගෝලීය පරිසරයෙන් දේශීය ව්‍යාපාර සඳහා හිතකර මෙන්ම අහිතකර බලපෑම් ද ඇතිවේ. එසේ ඇතිවන අහිතකර බලපෑමට උදාහරණයකි,
    (1) විදේශ ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම (2) දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යාම
    (3) නවීන තාක්ෂණය භාවිතයට ගැනීමට හැකි වීම (4) ගුණාත්මක විදේශ අමුද්‍රව්‍ය ලබාගත හැකි වීම

05. ව්‍යාපාර පරිසර අධ්‍යයනයෙන් හඳුනාගත හැකි ශක්තියක් හා අවස්ථාවක් පිළිවෙලින් දක්වා ඇත්තේ,

(1) අත්දැකීම් සහිත කළමනාකරුවන් සිටීම හා ව්‍යාපාර සඳහා බදු සහන හිමි වීම

(2) අධිවේගී මාර්ග ඉදිවීම හා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම

(3) පුහුණු සේවකයන් සිටීම හා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම

(4) රජය සහන පොළියට ණය ක්‍රම හඳුන්වා දීම හා පිළිගත් සන්නම් නාමයක් පැවතීම

06. ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම ව්‍යාපාරයකට,

(1) ශක්තියකි. (2) දුර්වලතාවයකි.

(3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

07. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී භාවිතා කරනු ලබන ප්‍රමාණාත්මක සාධකයක් නොවන්නේ,

(1) ව්‍යාපාරවල ප්‍රාග්ධන ප්‍රමාණය (2) සේවක සංඛ්‍යාව

(3) භාවිතා කරන බලශක්ති ප්‍රමාණය (4) නිෂ්පාදනයේ ස්වභාවය

08. හවුල් ව්‍යාපාරයකට සාපේක්ෂව ඒක පුද්ගල ව්‍යාපාරයක ඇති වාසියක් වන්නේ,

(1) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම (2) නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම

(3) වගකීම බෙදී යාම (4) ස්වාධීනව තීරණගත හැකි වීම

09. හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමේ දී ඒ සඳහා අදාළ නොවන නීතිමය තත්ත්වයක් වන්නේ,

(1) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත (2) 2007 අංක 7 දරණ සමාගම් පනත

(3) 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත (4) 1972 අංක 5 දරණ සමූපකාර සමිති පනත

10. කොටස් නිකුත් කර ප්‍රාග්ධනය සපයා ගන්නා අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් පාලනය වන නෛතික පුද්ගලභාවයක් සහිත ව්‍යාපාර සංවිධානය වන්නේ,

(1) තනි ව්‍යාපාර (2) සංස්ථාපිත සමාගම්

(3) දෙපාර්තමේන්තු (4) සමූපකාර ව්‍යාපාරය

11. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම හවුල්කරුවන් ගණන සඳහන් පනත කුමක් ද?

(1) 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත

(2) 2007 අංක 7 දරණ සමාගම් පනත

(3) 1972 අංක 5 දරණ සමූපකාර පනත

(4) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

12. කොටස්කරුවන්ගේ වගකීම සීමිත වන ව්‍යාපාර .... වන අතර ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් හා පෞද්ගලික අංශයට අයත් සංවිධානය .... වේ.

(1) සංස්ථාපිත සමාගම්, සමූපකාර (2) හවුල්, සමූපකාර

(3) ඒක පුද්ගල ව්‍යාපාර, සංස්ථාපිත සමාගම් (4) සංස්ථාපිත සමාගම්, හවුල් ව්‍යාපාර

13. පහත දක්වෙන්නේ විදේශ මුදල් අතරින් යුරෝපා සංගමයට අයත් රටවල පොදු මුදල් ඒකකය වන්නේ,

(1) ඇමරිකානු ඩොලර් (2) බ්‍රිතාන්‍ය පවුම්

(3) යුරෝ (4) ජපානයේ යෙන්

14. නීතිමය කටයුතුවලදී ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටිය යුතු ආයතනය වන්නේ,

(1) රාජ්‍ය සංස්ථා (2) රාජ්‍ය දෙපාර්තමේන්තු
(3) සමූපකාර (4) සංස්ථාපිත සමාගම්

15. ගිණුම්කරණයේ ප්‍රධානම අරමුණ වන්නේ,

(1) නීතිමය අවශ්‍යතා ඉටු කිරීමයි.
(2) ව්‍යාපාරය උපයා ඇති ලාභය ගණනය කිරීමයි.
(3) ව්‍යාපාරය පිළිබඳ ඇල්මැති පාර්ශවයන්ට අවශ්‍ය තොරතුරු සැපයීමයි.
(4) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය ගණනයයි.

16. මහේෂ් 2020.04.01 දින රු. 250 000 ක් ආයෝජනය කරමින් ව්‍යාපාරයක් අරඹන ලදී. 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයට ව්‍යාපාරයේ මුළු ආදායම රු. 160 000 ක් හා මුළු වියදම රු. 110 000 ක් බව ඔහු පවසයි. වර්ෂය තුළ රු. 25 000 තම පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා ව්‍යාපාරයෙන් ලබාගෙන ඇත. 2020.12.31 දිනට ව්‍යාපාරයේ හිමිකම කොපමණ ද?

(1) රු. 325 000 කි. (2) රු. 300 000 කි.
(3) රු. 225 000 කි. (4) රු. 275 000 කි.

17. බැංකු ණය ගිණුම ව්‍යාපාරයේ,

(1) ආදායම් ගිණුමකි. (2) වියදම් ගිණුමකි.
(3) වගකීම් ගිණුමකි. (4) වත්කම් ගිණුමකි.

18. බැංකු ගිණුමට අදාළ මූලාශ්‍ර ලේඛනයක් වන්නේ,

(1) ගැණුම් ඉන්වොයිසියයි. (2) විකුණුම් ඉන්වොයිසියයි.
(3) ජර්නල් වවුචරයයි. (4) බැංකු ප්‍රකාශනයයි.

19. එක්තරා ව්‍යාපාරයක භාණ්ඩයක ලකුණු කළ මිල රු. 25 000 කි. විකුණුම් අවස්ථාවේ අඩු කරන වට්ටම 10% නම් වට්ටම අඩු කළ පසු භාණ්ඩයේ ශුද්ධ වටිනාකම වන්නේ,

(1) රු. 1 250 ක් වේ. (2) රු. 22 500 ක් වේ.
(3) රු. 1 500 ක් වේ. (4) රු. 23 500 ක් වේ.

20. දුන් වට්ටම් ගිණුම්වල ද්විත්ව සටහන නිවැරදිව සටහන් කර ඇති පිළිතුර වන්නේ,

(1) දුන් වට්ටම් ගිණුම හර
ණයගැති ගිණුම බැර

(2) ණයගැති ගිණුම හර
දුන් වට්ටම් ගිණුම බැර

(3) දුන් වට්ටම් ගිණුම හර
ණයහිමි ගිණුම බැර

(4) ණයහිමි ගිණුම හර
දුන් වට්ටම් ගිණුම බැර

21. අනිල්ගේ ව්‍යාපාරයේ 2022 ජනවාරි මාසයේ සුළු මුදල් වියදම රු. 2 750 ක් විය. සුළු මුදල් භාරකරු සතුව පැවති අත ඉතිරි මුදල රු. 250 කි. පෙබරවාරි මාසයේ පළමු දින සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම තවත් රු. 500 කින් වැඩි කිරීමට තීරණය කර ඇත්නම් පෙබරවාරි පළමු දින ප්‍රතිපූරණය කරන මුදල වන්නේ,

(1) රු. 3 250 කි. (2) රු. 3 000 කි.
(3) රු. 3 350 කි. (4) රු. 3 500 කි.

22. අසංකගේ ව්‍යාපාරයේ රු. 50 000 භාණ්ඩ සංබට විකුණූ අතර ඔහු ඒ සඳහා පසුව රු. 50 000 ක චෙක්පතක් ලබාදෙන ලදී. එම චෙක්පත බැංකු ජංගම ගිණුමේ තැන්පත් කළ අතර පසුව එය අගරු වූ බව අසංකට දැනුම් දෙන ලදී. මෙම චෙක්පත අගරු වීමට බලපෑ හැකි හේතුවක් නොවන්නේ,

(1) අසංකගේ ජංගම ගිණුමේ මුදල් නොතිබීම
(2) සංබගේ ජංගම ගිණුමේ මුදල් නොතිබීම
(3) චෙක්පත අවිධිමත්ව ලියා තිබීම
(4) චෙක්පතේ අත්සන යොදා නොතිබීම

23. බැංකු ගිණුම සංශෝධනයේ දී සලකා බැලිය යුතු බැංකු ප්‍රකාශයේ ඇතුළත් ව ඇති අයිතමයන් වන්නේ,

(1) ඍජු ප්‍රේෂණ ලැබීම, ස්ථාවර නියෝග ගෙවීම, නිකුත් කර ඉදිරිපත් නොවූ චෙක්පත්
(2) ඍජු ප්‍රේෂණ ලැබීම, ස්ථාවර නියෝග ගෙවීම, බැංකු ගාස්තු
(3) තැන්පත් කළ නිෂ්කාශනය නොවූ චෙක්පත්, බැංකු ගාස්තු, ඍජු ප්‍රේෂණ
(4) තැන්පත් කළ නිෂ්කාශනය නොවූ චෙක්පත්, නිකුත් කර ඉදිරිපත් නොවූ චෙක්පත්, බැංකු ගාස්තු

24. ව්‍යාපාරයක 2022.01.31 දිනට සංශෝධිත බැංකු ගිණුමට අනුව ශේෂය රු. 310 000 කි. එදිනට තැන්පත් කර නිෂ්කාශනය නොවූ චෙක්පත් හා නිකුත් කළ ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම් පිළිවෙලින් රු. 85 000 හා රු. 45 000 ක් විය. 2022.01.31 දිනට බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය වන්නේ,

(1) රු. 350 000 කි.
(2) රු. 310 000 කි.
(3) රු. 265 000 කි.
(4) රු. 270 000 කි.

25. බැංකු ජංගම ගිණුම හරහා ගනුදෙනු සිදු කිරීමේ දී ව්‍යාපාරිකයෙකුට අත්විය හැකි ප්‍රතිලාභයක් නොවන්නේ,

(1) අයිරා පහසුකම් ලැබීම
(2) ප්‍රේෂණ රැස් කරවාගත හැකි වීම
(3) චෙක්පත් මඟින් ගනුදෙනු කළ හැකි වීම
(4) බැංකු ගාස්තු අය කිරීම

26. පහත සඳහන් ගනුදෙනු වලින් ගැණුම් ජ'නලයේ සටහන් කරන ගනුදෙනුව වනුයේ,

(1) ණයට මිලට ගන්නා සියලුම වත්කම්
(2) නැවත විකිණීමේ අරමුණින් මිලදී ගන්නා වෙළෙඳ භාණ්ඩ ණයට ගැණුම්
(3) වෙළෙඳ භාණ්ඩ ණයට ගැණුම්
(4) වෙළෙඳ භාණ්ඩ ණයට විකුණුම්

27. විකුණුම් ජ'නලයේ එකතුව මාරු කළ යුත්තේ,

(1) ගැණුම් ගිණුමට ය.
(2) විකුණුම් ගිණුමට ය.
(3) ණයගැති ගිණුම්වලට ය.
(4) ණයහිමි ගිණුම්වලට ය.

28. රු. 20 000 විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම අමතක කර ගිණුම්කරණ ක්‍රියාවලිය තුළින් ශේෂ පිරික්සුම පිළියෙල කර ඇත. මෙම වැරදීම සිදු කර ඇත්තේ,

(1) මූලික සටහන් පොත්වල ගනුදෙනු සටහන් කිරීමේ දී ය.
(2) ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේ දී ය.
(3) ලෙජර් ගිණුම් තුලනය කිරීමේ දී ය.
(4) ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී ය.

29. පහත සඳහන් වැරදි අතරින් ශේෂ පිරික්සුමේ සමානාත්වයට බලපෑමක් ඇති කරන වරදක් වන්නේ,

(1) රු. 20 000 විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත්වලින් මගහැරීම

(2) රු. 20 000 ණයට ගැනුම් රු. 2 000 ලෙස ගිණුම්වල සටහන් වීම

(3) රු. 10 000 ණයගැතියන්ගෙන් ලැබීම් රු. 15 000 ලෙස ගිණුම්වල සටහන් වීම

(4) රු. 5 000 අත්පිට විකුණුම් මුදල් පොතේ පමණක් සටහන් වීම

30. ණයහිමියෙකු වූ අජිත්ට ගෙවන ලද රු. 2 000 ක මුදල මුදල් පොතේ නිවැරදිව සටහන්ව ඇති නමුත් අජිත්ගේ ගිණුමේ සටහන් වී නොමැත. මෙම වරද නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන වන්නේ,

(1) අජිත් ගිණුම හර රු. 20 000 මුදල් පොත බැර රු. 20 000

(2) අජිත් ගිණුම හර රු. 20 000 අවිනිශ්චිත ගිණුම බැර රු. 20 000

(3) මුදල් පොත හර රු. 20 000 අජිත් ගිණුම බැර රු. 20 000

(4) අවිනිශ්චිත ගිණුම හර රු. 20 000 අජිත් ගිණුම බැර රු. 20 000

31. ගිණුම් ලිපිකරුවෙකු විසින් පහත ප්‍රකාශයක් සිදුකරයි. මේවා අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ගැණුම් ජ'නලයේ එකතුව ගැණුම් ගිණුමට හර කරයි.

(2) සියලු ගැණුම්, ගැණුම් ජ'නලයේ සටහන් කරයි.

(3) සුළු මුදල් පොතේ වියදම්වල එකතුව විවිධ වියදම් ගිණුමට හර කරයි.

(4) යන්ත්‍ර අලුත්වැඩියා වියදම් යන්ත්‍ර ගිණුමට හර කරයි.

32. පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනුවක් වන්නේ,

(1) ව්‍යාපාරය සඳහා වෙළෙඳ භාණ්ඩ ණය පදනම මත ලබාගැනීම

(2) රු. 5 000 විදුලි ගාස්තු ගෙවීම

(3) ඉඩමක් ණය පදනම මත ගැනීම

(4) අයිතිකරු වෙළෙඳ භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම

33. බැංකු ගිණුමේ සඳහන් ශේෂය බැංකු ගිණුම් විස්තරයේ සඳහන් ශේෂයට වඩා වැඩි වීමට බලපාන හේතුවක් වන්නේ,

(1) තැන්පත් කළත් නිෂ්කාශනය නොවූ චෙක්පත් වල අගය

(2) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්

(3) ඍජු ප්‍රේෂණයක්

(4) ඉහල සියල්ලම වේ.

34. ව්‍යාපාරයක ගැනිලි ගිණුම,

(1) වත්කම් ගිණුමකි. (2) වියදම් ගිණුමකි.

(3) හිමිකම් ගිණුමකි. (4) වගකීම් ගිණුමකි.

35. ජ'නල් වවුචරය මූලාශ්‍ර ලේඛනය කරගන්නා වූ මූලික පොත වන්නේ,

(1) මුදල් ගිණුම (2) බැංකු ගිණුම

(3) පොදු ජ'නලය (4) විකුණුම් ජ'නලය

36. කාලච්ඡේදය අවසානයේ විකුණුම් ජ'නලයේ එකතුව ද්විත්ව සටහන් මූලධර්මයට අනුව සටහන් වන්නේ,

(1) මුදල් ගිණුම හර
විකුණුම් ගිණුම බැර

(2) ණයගැති ගිණුම හර
විකුණුම් ගිණුම බැර

(3) විකුණුම් ගිණුම හර
ණයගැති ගිණුම බැර

(4) විකුණුම් ගිණුම හර
මුදල් ගිණුම බැර

37. භාණ්ඩ ණයට ගැනීම සටහන් කිරීමේ දී අනුගමනය කරනු ලබන ද්විත්ව සටහන වන්නේ,

(1) ගැණුම් ගිණුම හර
මුදල් ගිණුම බැර

(2) ගැණුම් ගිණුම හර
ණයහිමි ගිණුම බැර

(3) මුදල් ගිණුම හර
ගැණුම් ගිණුම බැර

(4) ණයහිමි ගිණුම හර
ගැණුම් ගිණුම බැර

38. මුදල් ගෙවීමේ දී උපයෝගී කරගනු ලබන මූලාශ්‍ර ලේඛනය වන්නේ,

(1) ලදුපත
(2) විකුණුම් ඉන්වොයිසිය
(3) ගැණුම් ඉන්වොයිසිය
(4) වවුචරය

39. පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ ඇති අවාසියකි,

(1) කාලීන දත්ත පහසුවෙන් ලබාගත හැකි වීම
(2) පරිගණක දත්ත ලබාගැනීමේ හා වෙනස් කිරීමේ අවදානමක් තිබීම
(3) අවශ්‍ය ශ්‍රමය අවම වීමෙන් මුදල් ඉතිරි වීම
(4) ස්වයංක්‍රීයව නිමවන ගිණුම් වාර්තාවල නිරවද්‍යතාවය ඉහළ වීම

40. පහත සඳහන් වැරදි නිවැරදි කිරීමේ දී අවිනිශ්චිත ගිණුමේ සටහන් වන වරදක් වන්නේ,

(1) රු. 10 000 ලී බඩු මිලදී ගැනීම පොත්වල සටහන් වී නොමැත.
(2) රු. 5 000 ගැණුම් ඉන්වොයිසියක් පොත්වල පසටහන් වීම අත්හැරී ඇත.
(3) විදුලි ගාස්තු ලෙස ගෙවූ රු. 2 000 මුදල් පොතේ පමණක් සටහන් වී ඇත.
(4) ණයහිමියන්ට ගෙවූ රු. 2 500 මුදල ගිණුම් පොත්වල දෙවරක් සටහන් වී ඇත.

***

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

සැලකිය යුතුයි :

❖ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. ශ්‍රීමතී කෘෂිකර්මය විෂය පිළිබඳ උපාධිධාරිනියක් වන අතර දැනට ඇය කෘෂිකර්ම නිළධාරිනියක ලෙස රාජ්‍ය අංශයේ සේවය කරන්නීය. වර්තමානයේ පවතින ආර්ථික අර්බුද හමුවේ රැකියාවෙන් ලබන සුළු ආදායම ජීවත්වීමට ප්‍රමාණවත් නොවූ නිසා වෙනත් ආදායම් උත්පාදන මාර්ගයක් කෙරෙහි ඇය අවධානය යොමු කරන ලදී. ඒ අනුව ඇය වෘත්තියෙන් ලද අත්දැකීම් හා උපාධිය හැදෑරීමෙන් ලද න්‍යායාත්මක දැනුම ද පදනම් කරගනිමින් එළවළු වගා කර අලෙවි කිරීමේ ව්‍යාපෘතියක් "හරිත එළවළු නිෂ්පාදකයෝ " නමින් 2021.01.01 දින ආරම්භ කරන ලදී. මේ සඳහා ඇය සතුව තිබූ රු. 500 000 ක මුදල ව්‍යාපාරය සඳහා ආයෝජනය කරන ලදී. පසුදින ඇය ව්‍යාපාරය කරගෙන යාමට අවශ්‍ය උපකරණ මිලදීගැනීමට රු. 200 000 ද එළවළු බීජ මිලදී ගැනීමට රු. 50 000 ක් ද යොදවන ලදී.

කෘෂිකර්ම උපාධිධාරිනියක් වන තම මිතුරු කමලනී ද ව්‍යාපාරයට වැඩ පරීක්ෂකවරියක් ලෙස සම්බන්ධ කරගත් අතර ව්‍යාපාරයේ කම්කරුවන් ලෙස තවත් සේවකයන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී. ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයකට ඉතාම සමීපයෙන් තම ව්‍යාපාරය පිහිටා තිබීම නිසා අලෙවි කිරීමේ ගැටලු ද අවම විය. 2021.01.01 සිට 2021.01.07 දක්වා වූ සතිය තුළ ව්‍යාපාරය තුළ පහත ගනුදෙනු සිදු විය.

2021.01.02	එළවළු සඳහා කොම්පෝස්ට් පොහොර සඳහා	රු.	50 000
2021.01.03	ජංගම ගිණුමක් ආරම්භ කළා	රු.	5 000
2021.01.04	ජල බිල්පත් සඳහා ගෙවීම	රු.	3 000
2021.01.05	ද්‍රව්‍ය ගෙන ඒමේ වියදම්	රු.	5 000
2021.01.07	සේවකයන්ට ගෙවූ අත්තිකාරම් මුදල්	රු.	7 000

ඉහත සිද්ධිය ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඉහත සිද්ධියට අදාළ ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) ඔබ ඉහත (i) හි සඳහන් කළ ව්‍යාපාර සංවිධානයේ වාසියක් හා අවාසියක් ලියන්න.

(iii) (අ) මෙම ව්‍යාපාරය සතු අවස්ථාවක් හා ශක්තියක් ලියන්න.

(ආ) මෙම ව්‍යාපාරයට තර්ජනයක් විය හැකි යැයි ඔබ සිතන ඇල්මැති පාර්ශවයක් ලියන්න.

(iv) (අ) මෙම සිද්ධියට අදාළ නිෂ්පාදන සාධක 02 ක් ලියන්න.

(ආ) ඔබ දැක්වූ නිෂ්පාදන සාධක සඳහා සිද්ධිය ඇසුරින් උදාහරණ බැගින් ලියන්න.

(v) මෙම ව්‍යාපාර සංවිධානය ලියාපදිංචි කළ යුතුද? හේතු දක්වන්න.

(vi) ශ්‍රීමතීගේ ව්‍යාපාරයේ 2021.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.

(vii) ඉහත ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය මූලික සටහන් පොතක් හා ඊට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරන්න.

(viii) 2021.01.07 දිනට මුදල් පොතේ ශේෂය දක්වන්න.

(ix) මෙම ව්‍යාපාරයේ ජංගම වත්කමක් හා ජංගම නොවන වත්කමක් සඳහන් කරන්න.

(x) මෙම ව්‍යාපාරය විසින් දරණ ලද වියදම් වර්ග 02 ක් වටිනාකම් සහිතව ලියා දක්වන්න.

(ලකුණු 2 × 10 = 20)

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න)

02. (i) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 04 ක් ලියන්න.

(ii) ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශව 02 ක් නම් කර, එක් එක් පාර්ශවය ඉටු කරගැනීමට අපේක්ෂිත අරමුණ බැගින් දක්වන්න.

(iii) ගෝලීය පරිසරයේ අහිතකර බලපෑම් 02 ක් දක්වන්න.

(iv) අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි ආකාරය ගැලීම් සටහනකින් දක්වන්න.

(ලකුණු 02 × 4 = 08)

03. (i) හවුල් ව්‍යාපාරයක් හා සම්බන්ධයෙන් ඇති අසීමිත වගකීම යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ii) ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමෙන් ඇතිවන වාසි 02 ක් ලියන්න.

(iii) තනි ව්‍යාපාරයක් හා සසඳන කළ හවුල් ව්‍යාපාරයක ඇති වාසි 02 ක් දක්වන්න.

(iv) හවුල් ව්‍යාපාරයක සිටිය යුතු හවුල්කරුවන් ගණන සඳහන් පනත නම් කරන්න.

(ලකුණු 02 × 4 = 08)

04. (i) සංස්ථාපිත සමාගමක කළමනාකරණ කටයුතු සිදු කරන්නේ කවුරුන් විසින් ද?

(ii) සමූපකාර සමිතියක ලක්ෂණ 02 ක් ලියන්න.

(iii) දෙපාර්තමේන්තුවල දැකිය හැකි ප්‍රධාන අවාසි 02 ක් දක්වන්න.

(iv) ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ සැලකිල්ලට ගන්නා සාධක 02 ක් දක්වන්න.

(ලකුණු 02 × 4 = 08)

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න)

05. (i) (අ) ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ දක්වන්න.

(ආ) ගනුදෙනු තුළින් බිහිවන ප්‍රතිඵල 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත දැක්වෙන්නේ සුමනසිරි ව්‍යාපාරයේ 2022 අගෝස්තු මස මුල් සතියේ සිදු වූ ගනුදෙනු වේ.

2022.08.01	අයිතිකරු යෙදූ ප්‍රාග්ධනය	රු.	100 000
2022.08.02	භාණ්ඩ අත්පිට ගැනුම්	රු.	20 000
2022.08.04	බැංකු ණයක් ගත්තා	රු.	50 000
2022.08.06	ලී බඩු මිලට ගත්තා	රු.	20 000
2022.08.07	සිල්වාගෙන් භාණ්ඩ ණයට ගත්තා	රු.	5 000

අවශ්‍ය වන්නේ,

ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම දක්වන්න. (ලකුණු 05)

(iii) අමල්ගේ ව්‍යාපාරයේ 2021.01.31 දිනට බැංකු ගිණුමේ හර ශේෂය රු. 25 100 වුවද එදිනට බැංකු ප්‍රකාශන ශේෂය ඊට වෙනස් විය. වෙනසට හේතු පහත දක්වේ.

1.	නිකුත් කළත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්	රු.	10 000
2.	තැන්පත් කළත් උපලබ්ධි නොවූ චෙක්පත්	රු.	7 000
3.	බැංකුව අයකළ බැංකු ගාස්තු	රු.	1 500
4.	ණයගැති ප්‍රේෂණ	රු.	4 000

අවශ්‍ය වන්නේ,

(අ) 2021.01.31 දිනට සංශෝධිත බැංකු ගිණුම

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය (ලකුණු 05)

06. (i) (අ) මූලාශ්‍ර ලේඛනවල ඇති ප්‍රයෝජන 02 ක් ලියන්න.

(ආ) විකුණුම් ජ'නලයේ මූලාශ්‍ර ලේඛනය කුමක් ද? (ලකුණු 02)

(ii) සුවිමාලිගේ ව්‍යාපාරයේ 2022 මැයි මාසයේ පළමු සතියේ සිදු වූ ගනුදෙනු පහත දක්වේ.

2022.05.01	සුවිමල් යෙදූ ප්‍රාග්ධනය	රු.	200 000
2022.05.02	අත්පිට ගැණුම්	රු.	100 000
2022.05.03	අත්පිට විකුණුම්	රු.	150 000
2022.05.04	බැංකු ණයක් ගත්තා	රු.	50 000
2022.05.05	විදුලිබිල ගෙව්වා	රු.	3 000
2022.05.06	සමන්ගෙන් ලී බඩු ණයට ගත්තා	රු.	30 000

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම

(ආ) 2022.05.07 දිනට මුදල් ශේෂය ලබාගැනීම (ලකුණු 05)

(iii) රාෂිගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 3 000 කි.
2021.12.31 දිනට සුළු මුදල් ශේෂය රු. 500 කි.
2022.01.01 සුළු මුදල් ප්‍රතිපූරණය කළා.

ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු පහත දක්වේ.

01.03	ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම	රු.	300
01.04	සීනි හා තේ කොළ වියදම	රු.	400
01.10	ත්‍රීරෝද රථ ගාස්තු	රු.	400
01.15	සිසිල් බීම සඳහා	රු.	150
01.20	ෆයිල් කවර සඳහා	රු.	250
01.25	ඉසුරුට ගෙවීම්	රු.	1 000
01.27	පිරිසිදු කිරීමේ වියදම	රු.	300

අවශ්‍ය වන්නේ,

විශ්ලේෂණ තීරු සඳහා සංග්‍රහ වියදම්, ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය වියදම් හා විවිධ වියදම් යොදා ගනිමින් සුළු මුදල් පොත පිළියෙල කර ගනුදෙනු සටහන් කිරීම (ලකුණු 05)

07. (i) (අ) ගැණුම් ඉන්වොයිසියක අඩංගු කරුණු 02 ක් ලියන්න.

(ආ) මූල්‍ය වාර්තා සකස් කිරීමට උපයෝගී කරගන්නා මෘදුකාංගයක් නම් කරන්න. (ලකුණු 02)

(ii) උමාෂාගේ ව්‍යාපාරයේ 2022 ජූලි මාසයේ සිදු වූ ණයට ගැණුම් පහත පරිදි වේ.

දිනය	ඉ. අංකය	සැපයුම්කරු	වටිනාකම (රු)
07.01	12	අමරනාත්	15 000
07.10	36	සිරිනාත්	20 000
07.20	45	ජයනාත්	25 000

අවශ්‍ය වන්නේ,

(අ) උමාෂාගේ ව්‍යාපාරයේ ජූලි මාසයට අදාළ ගැණුම් ජ'නලය

(ආ) ඉහත තොරතුරු ලෙජරයට පිටපත් කිරීම (ලකුණු 05)

(iii) සුවහස්ගේ ව්‍යාපාරයේ 2021.12.31 පිළියෙල කළ ශේෂ පිරික්සුම සමාන නොවූයෙන් එහි වෙනස වූ රු. 8 500 අවිනිශ්චිත ගිණුමට බැර කරන ලදී. පසුව වැරදි සඳහා හේතු වූ කරුණු අනාවරණය විය.

1. ගැණුම් ගිණුමේ වටිනාකම රු. 10 000 අඩුවෙන් සටහන් කර ඇත.
2. ගමන් ගාස්තු ගිණුමේ එකතුව රු. 1 500 ශේෂ පිරික්සුමට උපුටාගෙන නැත.
3. රක්ෂණ ගාස්තු ගිණුමේ ශේෂය වූ රු. 20 000 ශේෂ පිරික්සුමට සටහන් වී නොමැත.
4. රු. 40 000 වූ ගෙවූ ගෙවල් කුලී මුදල් පොතේ සටහන් කර නැත.

අවශ්‍ය වන්නේ,

(අ) වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්

(ආ) අවිනිශ්චිත ගිණුම (ලකුණු 05)

***

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

අවසාන වාර පරීක්ෂණය - 2022

ලකුණු දීමේ ක්‍රියාපටිපාටිය

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

01.	(4)	11.	(2)	21.	(1)	31.	(1)
02.	(3)	12.	(2)	22.	(1)	32.	(3)
03.	(2)	13.	(3)	23.	(2)	33.	(1)
04.	(2)	14.	(2)	24.	(4)	34.	(2)
05.	(1)	15.	(3)	25.	(4)	35.	(3)
06.	(4)	16.	(4)	26.	(2)	36.	(2)
07.	(4)	17.	(3)	27.	(2)	37.	(2)
08.	(4)	18.	(4)	28.	(1)	38.	(1)
09.	(4)	19.	(2)	29.	(4)	39.	(2)
10.	(2)	20.	(1)	30.	(2)	40.	(3)

(ලකුණු 1 × 40 = 40)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

01. (i) තනි ව්‍යාපාර / කේවල ස්වාමි ව්‍යාපාර / තනි පුද්ගල ව්‍යාපාර (ලකුණු 02)

(ii)

වාසි	අවාසි
★ ස්වාධීනව තීරණගත හැකි වීම	★ පාඩු තනිව විඳදරාගැනීමට සිදුවීම
★ ලාභ තනිව භුක්ති විඳිය හැකි වීම	★ තනි තීරණ අසාර්ථක වීම
★ පහසුවෙන් ආරම්භ කළ හැකි වීම	★ නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
★ නෛතික බලපෑම අඩු වීම	★ අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
(වාසි 01 - ලකුණු 01)	★ වගකීම අසීමිත වීම
	(අවාසි 01 - ලකුණු 01)

(iii) (අ) අවස්ථාවක් : ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයට ආසන්නව පිහිටීම (ලකුණු 1/2)
ශක්තියක් : කෘෂිකර්මය පිළිබඳ උපාධිධාරිනියක් වීම (ලකුණු 1/2)

(ආ) තරඟකරුවන්, රජය, සැපයුම්කරුවන් (ලකුණු 01)

(iv) (අ) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය (ලකුණු 01)

(ආ) භූමිය - ව්‍යාපාරය පවත්වාගෙන යන ඉඩම
ශ්‍රමය - සුපරීක්ෂක, සේවකයන්
ප්‍රාග්ධනය - මුදල්, උපකරණ
ව්‍යවසාය - ශ්‍රීමතී නිෂ්පාදන සාධක මෙහෙයවමින් ව්‍යාපාරය කරගෙන යාම

(ලකුණු 1/2 × 2 = 01)

(v) ඔව්

<u>අයිතිකරුගේ සම්පූර්ණ නමින් ව්‍යාපාරය පවත්වාගෙන නොයන බැවින්</u> අදාළ පළාත් සභා ව්‍යාපාර නාම ප්‍රඥප්තියට අනුව නාමය ලියාපදිංචි කළ යුතුය.

(ඉරි ඇඳි පද අනිවාර්ය වේ.) (ලකුණු 02)

(vi) වත්කම් = හිමිකම් + වගකීම්
+500 000 = +500 000
(මුදල්) (ප්‍රාග්ධනය) (ලකුණු 02)

(vii) මුදල් පොත - ලදුපත, වවුචරය
බැංකු ගිණුම - බැංකු ප්‍රකාශය, පිළිපත, අගරුපත් නිවේදනය (ලකුණු 02)

(viii)

හර | මුදල් ගිණුම | බැර

දිනය	ල අ	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	ච අ	විස්තරය	ස පි	වටිනාකම රු.
2021. 01.01		ප්‍රාග්ධන ගිණුම		5 950	01.02		උපකරණ ගිණුම		200 000
		(ල. 1/2)			01.02		බීජ ගැණුම්		50 000
					01.02		කොම්පෝස්ට්		50 000
					01.03		බැංකු ගිණුම		5 000
				(ල 01)	01.04		ජල බිල්පත් ගිණුම		3 000
					01.05		ගෙනල්මේ වියදම්		5 000
					01.07		සේවක අත්තිකාරම්		7 000
					01.07		ශේෂය ප/ගෙ (ල 1/2)		180 000
				500 000					500 000
01.08		ශේෂය ඉ/ගෙ		180 000					

(ix) ජංගම වත්කම් - මුදල් ශේෂය, බැංකු ශේෂය

ජංගම නොවන වත්කම් - උපකරණ, ඉඩම (ලකුණු 02)

(x) ජල බිල්පත් රු. 3 000

ගෙනල්මේ වියදම් රු. 5 000

කොම්පෝස්ට් මිලදී ගැනීම රු. 50 000

සේවක අත්තිකාරම් ගෙවීම රු. 7 000 (ලකුණු 02)

02. (i)

අවශ්‍යතා	වුවමනා
★ අත්‍යවශ්‍ය වේ	★ අත්‍යවශ්‍ය නොවේ
★ සරලයි	★ සංකීර්ණයි
★ නිර්මාණය කළ නොහැක	★ නිර්මාණය කළ හැකිය
★ සීමිතයි	★ විවිධයි

(ලකුණු 02)

(ii)

ඇල්මැති පාර්ශව		අරමුණු
1	අයිතිකරු	● ආයෝජනයේ සුරක්ෂිත බව ● ප්‍රමාණවත් ලාභයක් ලැබීම ● ව්‍යාපාරයේ අනාගත වර්ධනය
2	කළමනාකරු	● තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීමට ● රැකියා වර්ධනය ● රැකියා තෘප්තිය
3	සේවකයන්	● සාධාරණ වැටුපක් ලබාගැනීම ● රැකියාවේ සුරක්ෂිත බව
4	ගනුදෙනුකරු	● සාධාරණ මිලට නිෂ්පාදිත මිලට ගැනීමට ● ගුණාත්මක නිෂ්පාදිත ලබාගැනීමට
5	සැපයුම්කරුවන්	● අඛණ්ඩව ඇණවුම් ලබාගැනීමට ● නිසි පරිදි මුදල් ලබාගැනීමට
6	මූල්‍ය ආයතන	● දෙන ලද ණය අයකරගැනීමට ● තවදුරටත් ණය සැපයීමට
7	රජය	● ආදායම් බදු ලබාගැනීමට ● රැකියා අවස්ථා උත්පාදනය කිරීම ● ජාතික නිෂ්පාදනයට දායක වීම
8	තරඟකරුවෝ	● තම නිෂ්පාදිතවල මිල තීරණයට ● තරඟයට මුහුණ දීමට
9	විභව ආයෝජකයින්	● ආයෝජන තීරණ ගැනීමට

(iii)
- ★ දැඩි තරඟකාරිත්වයට මුහුණ දීමට සිදුවීම
- ★ දේශීය පුහුණු ශ්‍රමය විදේශයට ඇදී යාම
- ★ දේශීය ව්‍යාපාරවල පැවැත්මට තර්ජනයක් වීම
- ★ දේශීය සංස්කෘතියට අයහපත් වෙනස්කම් සිදුවීම

(ලකුණු 02)

(iv)

ව්‍යාපාර සංවිධාන
- ලාභ අරමුණු කරගත් ව්‍යාපාර
  - පෞද්ගලික
    - ඒක පුද්ගල ව්‍යාපාර
    - හවුල් ව්‍යාපාර
    - සංස්ථාපිත සමාගම්
  - පොදු
    - රාජ්‍ය සමාගම්
- ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර
  - පෞද්ගලික
    - සමූපකාර
    - සමිති
  - පොදු
    - රාජ්‍ය සංස්ථා
    - රාජ්‍ය දෙපාර්තමේන්තු

03. (i) හවුල්කරුවන් යොදන මුදලට වඩා හවුල් ව්‍යාපාරයේ ණය වැඩි නම් එම ණය පියවීම සඳහා හවුල්කරුවන් පෞද්ගලික දේපල පවා කැපකළ යුතු වේ.

(ලකුණු 02)

(ii) අනන්‍යතාවයක් ලැබීම
ව්‍යාපාරයේ අයිතිය තහවුරු වේ
රජයෙන් ලබාදෙන දිරිගැන්වීම් ලබාගැනීමට සුදුසුකමක් වීම
ණය ලබාගැනීමට පහසු වේ (ලකුණු 02)

(iii)
- ★ වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම
- ★ වගකීම බෙදී යාම
- ★ වඩාත් හොඳ තීරණ ගත හැකි වීම (සාමූහික තීරණ)
- ★ හවුල්කරුවන්ගේ දක්ෂතා ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ගත හැකි වීම (ලකුණු 02)

(iv) 2007 අංක 7 දරණ සමාගම් පනත (ලකුණු 02)

04. (i) අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් (ලකුණු 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තිබීම
ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
සාමාජිකයන්ගේ සාමූහික අයිතිය
පොදු අවශ්‍යතා හා අරමුණු වලින් යුක්ත වීම (ලකුණු 02)

(iii)
- ★ රජයේ මූල්‍ය නීති සංග්‍රහය, ආයතන සංග්‍රහ හා විවිධ චක්‍ර ලේඛන අනුව කටයුතු කළ යුතු වීම
- ★ අතිරික්ත සේවකයන් සිටීම

(ලකුණු 02)

(iv)
- ★ අරමුණ
- ★ පරිමාණය
- ★ කළමනාකරණ කටයුතු කරන්නේ කවුරුන් ද යන වග (ලකුණු 02)

05. (i) (අ) ව්‍යාපාරවල කෙරෙහි ඇල්මැති පාර්ශවවල තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමයි.

(ලකුණු 01)

(ආ) වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් (ලකුණු 01)

(ii)

දිනය	වත්කම්	හිමිකම්	වගකීම්	
2022.08.01	+100 000 (මුදල්)	+100 000 (ප්‍රාග්ධනය)	-	(ල.01)
2022.08.02	+20 000 (තොගය)	-	-	
	-20 000 (මුදල්)	-	-	(ල.01)
2022.08.04	+50 000 (මුදල්)	-	+50 000 (බැංකු ණය)	(ල.01)
2022.08.06	+20 000 (ලී බඩු)	-	-	
	-20 000 (මුදල්)	-	-	(ල.01)
2022.08.07	+5 000 (තොගය)	-	+5 000 (ණයහිමි)	(ල.01)
	155 000	**100 000**	**55 000**	

(iii)

සංශෝධිත බැංකු ගිණුම

(ල 1/2)	ශේෂය ඉ/ගෙ	25 100	බැංකු ගාස්තු	1 500	(ල 1/2)
(ල 1/2)	ණයගැති ප්‍රේෂණ	4 000	ශේෂය ප/ගෙ	27 600	(ල 1/2)
		29 100		29 100	
	ශේෂය ඉ/ගෙ	27 600			

බැංකු සැසඳුම් ප්‍රකාශය

	රු.	රු.	
සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය		27 600	(ල. 1/2)
එකතු කළා			
නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්	10 000	10 000	(ල. 1/2)
		37 600	(ල. 1/2)
අඩු කළා			
තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්	(7 000)	(7 000)	(ල. 1/2)
		30 600	(ල. 1/2)
බැංකු ප්‍රකාශයට අනුව ශේෂය		30 600	(ල. 1/2)

06. (i) (අ)
- ★ ගනුදෙනුවලට අදාළ මූලික ලියවිල්ලක් ලෙස යොදාගත හැකිය.
- ★ ගනුදෙනුවට අදාළ ලිඛිත සාක්ෂියක් ලෙස යොදාගත හැකිය.
- ★ ගනුදෙනුවට අදාළ අතිරේක තොරතුරු ලබාගත හැකි වීම
- ★ මූලික සටහන් පොත්වල ලිවීමේ දී යොදාගත හැකිය.

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 01)

(ආ) විකුණුම් ඉන්වොයිසිය (ලකුණු 01)

(ii) (අ)

මුදල් ගිණුම

දිනය	ල අ	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	ව අ	විස්තරය	ස පි	වටිනාකම රු.
05.01		ප්‍රාග්ධන ගිණුම		200 000	05.02		ගැණුම් ගිණුම		100 000
05.03		විකුණුම් ගිණුම		150 000	05.05		විදුලි ගාස්තු ගිණුම		3 000
05.04		බැංකු ණය ගිණුම		50 000					
					05.07		ශේෂය ප/ගෙ		297 000
				400 000					400 000
05.08		ශේෂය ඉ/ගෙ		297 000					

(මුදල් ගිණුමේ ඕනෑම නිවැරදි අයිතම 03 සඳහා ලකුණු 1 1/2 වේ.)

ප්‍රාග්ධන ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.
				05.01	මුදල් ගිණුම		200 000
							(ල. 1/2)

විකුණුම් ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.
				05.03	මුදල්		150 000
							(ල. 1/2)

බැංකු ණය ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.
				05.04	මුදල් ගිණුම		50 000
							(ල. 1/2)

ගැණුම් ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.
05.02	මුදල් ගිණුම						
	(ල. 1/2)						

විදුලි ගාස්තු ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.
05.05	මුදල්		3 000				
	(ල. 1/2)						

(ආ) රු. 297 000 (ලකුණු 01)

(iii) (අ)

සුවිමාලිගේ ව්‍යාපාරය

සුළු මුදල් පොත (ලකුණු 1/2)

	ලැබීම්	ස පි	දිනය	විස්තරය	ව අ	ගෙවීම්	විශ්ලේෂණ තීරු				ලෙජර් ගිණුම
							සංග්‍රහ	ගමන්	ලිපිද්‍රව්‍ය	විවිධ	
	500		01.01	ශේෂය ඉ/ගෙ							
(ල. 01)	2 500		01.01	මුදල්							
			01.03	ලිපිද්‍රව්‍ය		300			300		
			01.04	සීනි තේ කොළ		400	400				
			01.10	ත්‍රීරෝද රථ වියදම		400		400			
			01.15	සිසිල් බීම		150	150				
			01.20	ෆයිල්		250			250		
			01.25	ඉසුරුට ගෙවීම		1 000					1 000
			01.27	පිරිසිදු කිරීමේ වියදම්		300				300	
			01.31	ශේෂය ප/ගෙ (ල.1/2)		2 800	550	400	550	300	1 000
	3 000					200	ලෙ.පි	ලෙ.පි	ලෙ.පි	ලෙ.පි	ලෙ.පි
(ල.1/2)	200		02.01	ශේෂය ඉ/ගෙ		3 000	(ල.1/2)	(ල.1/2)	(ල.1/2)	(ල.1/2)	(ල.1/2)
	1 800		02.02	මුදල්							

07. (i) (අ)
- විකුණුම්කරුගේ නම ලිපිනය
- ගැණුම්කරුගේ නම ලිපිනය
- භාණ්ඩවල විස්තර
- භාණ්ඩ ප්‍රමාණය
- ඒකකයක මිල
- මුළු වටිනාකම
- කොන්දේසි
- බලයලත් නිළධාරි අත්සන

(ලකුණු 1/2 × 2 = 01)

(ආ) **Accpac** **MYOB**

Quick book **Sage** (ලකුණු 01)

(ii) (අ)

උමාෂාගේ ව්‍යාපාරය

ගැණුම් ජ'නලය (ලකුණු 1/2)

දිනය	ඉන්වොයිස් අංකය	සැපයුම්කරු	මුළු වටිනාකම රු.	ලෙජර් පිටුව	
07.01	12	අමරනාත්	15 000		(ල.1/2)
07.10	38	සිරිනාත්	20 000		(ල.1/2)
07.20	45	ජයනාත්	25 000		(ල.1/2)
07.30		ගැණුම් ගිණුමට හර කළා.	60 000		(ල. 01)

(ආ)

විකුණුම් ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.
				07.30	ණයගැති		60 000 (ල. 1/2)

අමරනාත් ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.
07.01	විකුණුම් ගිණුම		15 000 (ල. 1/2)				

සිරිනාත් ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.
07.10	විකුණුම් ගිණුම		20 000 (ල. 1/2)				

ජයනාත් ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු.
07.20	විකුණුම් ගිණුම		25 000 (ල. 1/2)				

(iii)

සුවහන් ව්‍යාපාරයේ
පොදු ජ'නලය

දිනය	වවුචර් අංකය	විස්තරය	ලෙ පි	හර රු.	බැර රු.
(ල. 01)		ගැණුම් ගිණුම හර අවිනිශ්චිත ගිණුම (ගැණුම් ගිණුමේ රු. 1 000 අඩුවෙන් සටහන් වූ වරද නිවැරදි කිරීම)		10 000	10 000
(ල. 01)		අවිනිශ්චිත ගිණුම (රු. 1 500 ගමන් ගාස්තු වියදම ශේෂ පිරික්සුමට උපුටා නොගැනීමේ වරද නිවැරදි කිරීම)			1 500

දිනය	වවුචර් අංකය	විස්තරය	ලෙ පි	හර රු.	බැර රු.
(ල. 01)		අවිනිශ්චිත ගිණුම (රක්‍ෂණ ගාස්තු ගිණුමේ රු. 20 000 ශේෂ පිරික්සුමට උපුටා නොගත් වරද නිවැරදි කිරීම)			20 000
(ල. 01)		අවිනිශ්චිත ගිණුම හර මුදල් ගිණුම (රු. 40 000 ගෙවූ ගෙවල් කුලී වියදම මුදල් පොතේ සටහන් නොවීමේ වරද නිවැරදි කිරීම)		40 000	40 000

හර අවිනිශ්චිත ගිණුම බැර

දිනය	විස්තරය	ලෙ පි	වටිනාකම රු.	දිනය	විස්තරය	ලෙ පි	වටිනාකම රු.
	මුදල් ගිණුම		40 000		ශේෂ පිරික්සුමේ වෙනස		8 500
					ගැණුම් ගිණුම		10 000
					රක්‍ෂණ ගිණුම		20 000
					ගමන් ගාස්තු ගිණුම		1 500
			40 000				40 000

(ඕනෑම නිවැරදි අයිතම 03 ක් හෝ ඊට වැඩි නම් ලකුණු 01 ක් ලබාදෙන්න.)

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න